පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සතිපාසල

සතිය -

විෂයය :- සිංහල

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

Department of Education,Sabaragamuwa Province/ Weekly School

## සාම්ප්‍රදායික යෙදුම්

### ප්‍රස්තාව පිරුළු

අවස්ථාවට උචිත කියමන් ප්‍රස්තාව පිරුළු නම් වේ.

උදා : උණ පුරුකේ දැම්මත් බලු වලිගේ ඇදේ නෑරේ.

අභ්‍යාසය :

ඔබ දන්නා ප්‍රස්තාව පිරුළු 10ක් ලියා දක්වන්න.

### රූඪී

භාවිත කරන වචනවල ප්‍රකටව පෙනෙන අර්ථයට වඩා වෙනස් අර්ථයක් ධ්වනිත වන ලෙස යෙදෙන භාෂාත්මක යෙදුම් වේ.

උදා : ඇඟේ ලේ වතුර වුණා
ගොළුබෙලි ගමන

අභ්‍යාසය :

01 කොටසේ අරුත්වලට ගැළපෙන රූඪී 02 කොටසින් තෝරන්න.

| 01 කොටස | 02 කොටස |
|---|---|
| කරදර පිට කරදර | වැල්වටාරම් |
| ආදායම පහත වැටීම | කොරේ පිටට මරේ |
| ගෞරවය නැති වී යාම | බහින කලාව |
| සුදන වෙස් ගත් දුදනා | උපාසක බළලා |
| අනවශ්‍ය විස්තර කිරීම | සායම යනවා |

## <u>යුගල පද</u>

01 එකිනෙකට විරුද්ධාර්ථවත් පද එකතු වීමෙන් සෑදෙන යුගල පද :

දුකට-සැපට

ඉහළ-පහළ

02 එකිනෙකට සමාන අර්ථ ඇති පද එකතු වීමෙන් සෑදෙන යුගල පද :

මිල-මුදල්

නඩු-හබ

03 එක් පදයක ශබ්දය අනුකරණය කරමින් අනෙක් පදය සැකසුණු යුගල පද :

අහළ-පහළ

අඟර-දඟර

04 පළමු පදය අර්ථවත් වූත්, දෙවෙනි පදය අර්ථ විරහිත වූත් පද එකතු වීමෙන් සෑදෙන යුගල පද:

රොඩු-බොඩු

ළමයි-බමයි

05 පූර්ව ක්‍රියා පද 02ක් එකතු වීමෙන් සෑදෙන යුගල පද :

කවා-පොවා

දුවලා-පැනලා

<u>අභ්‍යාසය :</u>

පහත සඳහන් පාඨයේ හිස්තැන්වලට ගැළපෙන පද සම්පූර්ණ කරන්න.

මේ කාමරයේ තියෙන .................. ලොට්ට අස් .................. කරලා ඔය සේරම රොඩු .................. පුච්චලා දාන්න. මට වත්ත .................. සුද්ධ .................. කරන්න තියෙනවා. අයියා ලවක් .................. නැතිව එහෙ .................. දුවනවා මිසක් ගෙයක් .................. එළි .................. කරලා දීලා අපට උදව් .................. කරනවයැ. දැන් දරුවන්ට වෙලාවක් .................. නෑ ඕවට.